## 2022 මාර්තු මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.03.18**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | පී.එල්. චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | චතුමිණි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVIII. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIX. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XX. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා

ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ මාර්තු මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය, මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.02.23 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.02.23 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.02.23 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>සංශෝධන</u>

I. 2022.02.23 දින පැවැති මහා සභාව සඳහා ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා සහභාගී වුවත්, 2022.02.23 දින මහා සභා වාර්තාවේ එතුමාගේ නම පැමිණීමේ සටහන් නොවී ඇති බැවින්, 2022.02.23 දින මහා සභා වාර්තාවේ පැමිණීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතාගේ නම ඇතුළත් විය යුතුය.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

<u>උප ලේඛනය</u>

රු. 50,000.00 ඉක්මවන ගෙවීම් විස්තරය

| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|
| I | LED 12.5 2Pin බල්බ් 600 ක් මිලදී ගැනීම | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | 1033 2022.02.28 | 321,600.00 |

| | | | | |
|---|---|---|---|---|
| II | 750x16 Ceat 16 PR ටයර් 02 ක් මිලදී ගැනීම | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව | MA0024146 2022.02.23 | 60,480.00 |
| III | 90 A බැටරි 02 ක් හා 100 A බැටරි 02 ක් මිලදී ගැනීම | ශාන්ති ටයර් මාර්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 9129 2022.02.27 | 90,600.00 |
| IV | 600x6 , 825x16 ටයර් මිලදී ගැනීම | ශාන්ති ටයර් මාර්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 9127 2022.02.27 | 107,300.00 |
| V | විදුලි උපකරණ මිලදී ගැනීම | ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් | 301 2022.02.21 | 59,300.00 |
| VI | LED 12.5 ස්කෘ බල්බ 100 ක් මිලදී ගැනීම | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | 1032 2022.02.28 | 536,000.00 |
| VII | කාර්යාල ගබඩාව සඳහා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | නිසිකෝ ගෝල්ඩ් හවුස් | 24542 | 34,920.00 |
| VIII | RD-4489 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා වෙනුවෙන් ගෙවීම් කිරීම | රුහුණු මෝටර්ස් අම්බලන්තොට | 818 2020.03.16 | 161,650.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ තැන්පත් ලේඛනයේ ඇති වසර 02 ට වැඩි මෙම තැන්පත් සභා ආදායමට ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ටෙන්ඩර් ඇප තැන්පත්</u>

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2017-03-15 | 6594 | වීරවිල වැව ඩී.සී. 6-7 ගොවි සංවිධානය | 2,550.00 |
| 02 | 2017-10-23 | 10152 | එච්.කේ. ප්‍රසන්න සුජීව | 500.00 |
| 03 | 2017-10-23 | 9880 | වන්නිගමගේ නිමලරංගන , අංක 63/සී , කිරින්ද , තිස්සමහාරාම | 500.00 |
| 04 | 2017-10-23 | 10166 | චමිල් තුෂාන් විජේසේකර , 42/3 , කිරිදිඇල්ල , බණ්ඩාරවෙල | 5,000.00 |
| 05 | 2017-10-23 | 10175 | ඒ.එම්. කසුන් දර්ශක , අංක 483/4 , මෝලකැපුපතාන , තිස්ස | 5,000.00 |
| 06 | 2017-10-23 | 10227 | එල්.බී. රංජිත් ප්‍රියන්ත , ප්‍රියන්ත නිවස , පන්නගමුව | 5,000.00 |
| 07 | 2017-10-23 | 10222 | හික්කඩුව විතාරණගේ , මාළිම්බඩ , පාලටුව | 5,000.00 |
| 08 | 2017-10-25 | 10086 | ඩී.එම්. ප්‍රදීප් වසන්ත , බෝධාගම පාර , තණමල්විල | 5,000.00 |
| 09 | 2017-10-25 | 10085 | කේ.එච්.ජීවන් , අංක 194/20 , පොල්ගහවැලැන , තිස්සමහාරාම | 5,000.00 |
| 10 | 2017-10-23 | 10168 | චමිල් තුෂාන් විජේසේකර , 42/3 , කිරිදිඇල්ල , බණ්ඩාරවෙල | 5,000.00 |
| 11 | 2017-10-23 | 9946 | වන්නිගමගේ නිමලරත්න , කිරින්ද ගොඩාන , කිරින්ද | 3,000.00 |
| 12 | 2017-10-23 | 10097 | සුදත් ගාමිණී රණසිංහ , අංක 10/ඒ , 10 කණුව , කිරින්ද | 3,000.00 |
| 13 | 2017-10-23 | 10154 | එච්.ඒ. ශාරා කෞෂල්‍යා , අංක 102/2ඒ , ටිකිරි උද්‍යානපුර , තිස්ස | 1,000.00 |
| 14 | 2017-10-23 | 10213 | බී.ඒ. ශ්‍රියා මල්කාන්ති , ළිඳ අසළ , උද්දගන්දර | 1,000.00 |
| 15 | 2017-10-23 | 10094 | කදිරවේල් පාර්වතී , දර්ශණගම , තිස්සමහාරාම. | 500.00 |
| 16 | 2017-10-23 | 10160 | කරුපන් ඉන්ද්‍රානි , දෙවාලේ ඉඩම , මහසෙන්පුර , තිස්සමහාරාම | 500.00 |
| 17 | 2017-10-23 | 10212 | ඒ.ජී. දිනේෂ් ලසන්ත , ටී.සී නිවස , දෙබරවැව , තිස්සමහාරාම. | 500.00 |
| 18 | 2017-10-23 | 10096 | කදිරවේල් පාර්වතී , දර්ශණගම , කොහොඹගහපැලැස්ස. | 500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 19 | 2017-10-23 | 10476 | හික්කඩුව විතාරණගේ බර්ටි , පන්නගමුව | 1,252.52 |
| 20 | 2017-10-23 | 10078 | වැල්ලහේනගේ සිරිසේන , විලමුල්ල , රණකෙළිය | 500.00 |
| 21 | 2017-11-07 | 10484 | එච්.ජේ.කේ. ආරියතිලක , කිරිඳි නදී මාවත , පොල්ගහවැලැන | 500.00 |
| 22 | 2017-11-17 | 10707 | ඒ.පී. දිනේෂා මධුවන්ති , 39/ඩී/2 , රන්මිණිතැන්න , තිස්ස | 500.00 |
| 23 | 2017-11-17 | 10709 | එච්.ඩබ්. ගුණපාල , අංක 10/2 , කොස්වත්ත පාර , තිස්සමහාරාම | 500.00 |
| 24 | 2018-12-10 | 4206 | සින්නතම්බි | 2,000.00 |
| 25 | 2018-01-18 | 12005 | ට්.පී. රත්නසිරි , අංක 438 , දර්ශනගම , තිස්සමහාරාම | 500.00 |
| 26 | 2018-12-12 | | එච්.කේ.එම්. සෝමපාල , කොහොඹගහවත්ත , තිස්සමහාරාම | 1,000.00 |
| 27 | 2018-12-13 | 4263 | කරුපයියා ඉන්ද්‍රානී , තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 3,000.00 |
| 28 | 2018-12-14 | 4280 | කරුපයියා වේලු , තිස්සමහාරාම බස්නැවතුම්පල අසළ වැසිකිළිය | 1,000.00 |
| 29 | 2018-12-14 | 4282 | කරුපයියා වේලු ,කිරින්ද පූජා නගර අසළ වැසිකිළිය | 3,000.00 |
| 30 | 2018-12-21 | 4459 | ශ්‍රියා මල්කාන්ති , තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පල | 5,000.00 |
| 31 | 2018-12-21 | 4565 | නලගමගේ කීර්තිරත්න , දෙබරවැව ධීවර වෙළඳසැල | 1,000.00 |
| 32 | 2018-07-18 | 12006 | ට්.පී. රත්නසිරි , දෙබරවැව , තිස්සමහාරාම | 255.00 |
| | | | **එකතුව** | **68,557.52** |

**<u>කඩ කුලී තැන්පත්</u>**

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2011-08-11 | 88672 | එම්.ජී.කේ. බුද්ධික , තිස්ස නව වෙලඳ සකීර්ණය දෙමහල්. අංක 15 | 3,000.00 |
| 02 | 2011-08-11 | 88674 | එම්.ජී.කේ. බුද්ධික , තිස්ස නව වෙලඳ සකීර්ණය දෙමහල්. අංක 16 | 3,000.00 |
| 03 | 2011-08-04 | 88757 | වල්පිට ගමගේ ධර්මදාස , තිස්ස නව වෙලඳ සකීර්ණය දෙමහල්. අංක 27 | 9,000.00 |
| 04 | 2011-08-04 | 88761 | වල්පිට ගමගේ ධර්මදාස , තිස්ස නව වෙලඳ සකීර්ණය දෙමහල්. අංක 28 | 133.68 |
| 05 | 2011-09-06 | 89596 | ලක්ෂ්මී සමරසූරිය , තිස්ස පොදු වෙළඳපොල , අංක 84 | 765.00 |
| 06 | 2011-09-12 | 89370 | ඒ.ජී. ජිනසේන , තිස්ස පූජා නගර රථවාහන පොල 11 පියවර අංක 02 | 900.00 |
| 07 | 2011-11-17 | 90265 | කුලරත්න විජේසේකර , තිස්ස පොදු වෙළඳපොල , කඩ අංක 99 | 900.00 |
| 08 | 2012-01-25 | 91593 | නාලක නිරෝෂන් තිස්ස පූජා නගර 11 පියවර අංක 27 | 900.00 |
| 09 | 2012-01-25 | 91595 | එස්.පී.එස්. කරුණාසීලී , තිස්ස පූජා නගර 11 පියවර අංක 27 | 900.00 |
| 10 | 2012-01-25 | 91597 | ආර්. ගුණසේන , තිස්ස පූජා නගර 11 පියවර අංක 29 | 900.00 |
| 11 | 2012-01-25 | 91599 | ඒ.කේ.ඒ. චන්ද්‍රලතා , තිස්ස පූජා නගර 11 පියවර අංක 09 | 900.00 |
| 12 | 2012-01-27 | 91705 | ඩී.එෆ්.එම්.ඒ. කරුණාරත්න , තිස්ස පූජා නගර 11 පියවර අංක 01-ජී | 1,710.00 |
| 13 | 2012-01-27 | 91707 | පී.එස්. ලතා , තිස්සස පූජා නගර දෙවන පියවර කඡ අංක 23 | 900.00 |
| 14 | 2012-01-31 | 91720 | කේ.එස්. අසේල , තිස්ස පූජා නගර දෙවන පියවර අංක 10 | 900.00 |
| 15 | 2012-12-04 | 963 | සභාපති , තල්සංවර්ධන මණ්ඩලය , තිස්ස පූජා නගර රථ පොළ අංක 09 | 1,500.00 |
| 16 | 2014-11-24 | 14558 | විදානගමගේ සරත් වෙලඳ සංකීර්ණය කඩ අංක 28 | 9,000.00 |
| 17 | 2015-09-23 | 15875 | කේ. පත්මසිරි , තිස්ස පූජා භූමිරථපොළ ඉදිරිපිට කඩ අංක 06 | 900.00 |
| 18 | 2015-05-21 | 18406 | එම්.එම්. රෙජිකා , දෙබරවැව පොදු වෙලඳපොළ අංක 06 , ඕ.පී. පියසේන මහතාට අයත් අංක 02 , එච්.එම්. රෙජිකා මහත්මියට | 2,400.00 |
| 19 | 2015-02-20 | 16722 | එස්. චාමර හිරුෂිකා , තිස්ස පොදු වෙලඳපොල කඩ අංක 35 | 330.00 |
| 20 | 2015-02-20 | 16718 | එස්.එච්. සංජීවනී , තිස්ස පොදු වෙලඳපොල කඩ අංක 36 | 330.00 |
| 21 | 2015-02-20 | 16714 | ප්‍රදීප් සුරංග කුලසේකර , තිස්ස පොදු වෙලඳපොල කඩ අංක 06 | 330.00 |
| 22 | 2015-05-13 | 18185 | කේ. දේවේන්ද්‍රා කුමුදුනී , තිස්ස පොදු වෙලඳපොල කඩ අංක 90 | 765.00 |
| 23 | 2015-06-04 | 18615 | එච්.කේ. ලීලාවතී , පූජා නගර රථපොල කඩ අංක 23 | 900.00 |
| 24 | 2015-07-29 | 19635 | ඩබ්.පී. ඥාණවතී , තිස්ස බස් නැවතුම්පොල කඩ අංක 06 | 1,800.00 |
| 25 | 2015-06-15 | 18855 | ඇල්බට් ආබේසූරිය , තිස්ස පොදු වෙලඳපොල කඩ අංක 71 | 750.00 |
| 26 | 2015-10-30 | 21230 | එච්.ඒ. රුචිර , කිරින්ද පූජා නගර රථපොල කඩ අංක 29 | 900.00 |

| | | | | |
|---|---|---|---|---|
| 27 | 2015-11-11 | 21380 | ජී.ජී.කේ. නිලේන්ද්‍රා , තිස්ස පොදු වෙළඳපොල අංක 60 කඩය | 750.00 |
| 28 | 2015-12-30 | 22355 | එච්.ටී. ජානක තිස්ස නව වෙළඳ සංකීර්ණය දෙමහල් අංක 16 | 3,000.00 |
| 29 | 2015-12-30 | 22361 | එල්.කේ. මුදිත නිරෝෂන් , තිස්ස නව වෙළඳ සංකීර්ණය අංක 20 | 3,000.00 |
| 30 | 2015-12-31 | 22366 | වයි.එම්.පී. නිශාන්ත , තිස්ස නව වෙළඳ සංකීර්ණය අංක 01 | 12,600.00 |
| 31 | 2015-12-31 | 22267 | ජී.එච්. මෙස්ලින් , දෙබරවැව දියවර ගොඩනැගිල්ල | 3,600.00 |
| 32 | 2016-03-18 | 23838 | දිස්නා කංකානම් පතිරණ, තිස්ස පොදු වෙළඳපොල අංක 101 | 900.00 |
| 33 | 2016-03-16 | 23924 | පී.බී. ආරියදාස , කිරින්ද පූජා නගර රථපොල අංක 15 | 975.00 |
| 34 | 2016-03-28 | 24189 | රාජපක්ෂ විතාරණගේ , තිස්ස නව වෙළඳ සංකීර්ණය අංක 19 | 22,500.00 |
| 35 | 2016-03-28 | 24196 | එම්.ඒ. මුණසිංහ , තිස්ස නව වෙළඳ සංකීර්ණය අංක 15 | 3,000.00 |
| 36 | 2016-03-28 | 24150 | අතුරලිය බඩල්ගේ රොෂාන් මංජු දෙබරවැව පො.වෙ.පො.අංක 02 | 9,000.00 |
| 37 | 2016-03-31 | 24459 | ජී.ජී. සංක විමුක්ති තිස්ස නව වෙළඳ සංකීර්ණය අංක 15 | 9,000.00 |
| 38 | 2016-04-07 | 24561 | පී.එම්. නයනා මල්කාන්ති දෙබරවැව පො.වෙ.පො.අංක 07 | 2,400.00 |
| 40 | 2016-01-11 | 22548 | ජී.ඥාණසිරි , තිස්ස පොදු වෙළඳ පොලඅංක 29 | 330.00 |
| 41 | 2016-02-05 | 23567 | ඩබ්.ඒ. රසිකා ප්‍රියදර්ශනී , දෙබරවැව පො.වෙ.පො.අංක 05 | 450.00 |
| 42 | 2016-03-30 | 24339 | එම්.එන්.එම්. මයිකල් ජයන්ත තිස්ස පොදු වෙළඳ පොලඅංක 80 | 765.00 |
| 43 | 2016-04-25 | 24862 | ඒ.එම්.ජේ. රත්නකුමාර ,දෙබරවැව පො.වෙ.පො.අංක 35 | 2,400.00 |
| 44 | 2016-02-29 | 23576 | ආර්.පී. ඥාණරත්න , බස් නැවතුම්පොළ කඩ අංක 06 | 2,535.00 |
| 45 | 2016-07-11 | 1560 | ආර්.පී. සමීර ප්‍රසන්න , තිස්ස පූජා නගර රථ පොළ අංක 10 | 900.00 |
| 46 | 2016-05-27 | 550 | ගමගේ සුරේකා , තිස්ස පොදු වෙළඳ පොල අංක 56 | 765.00 |
| 47 | 2016-08-08 | 24377 | එම්.ජී. ඇලන් , දෙබරවැව පො.වෙ.පො.අංක 34 | 2,400.00 |
| 48 | 2016-08-16 | 264 | ඩබ්.ඒ.කේ. ප්‍රේමසීලී , තිස්ස පොදු වෙළඳ පොල අංක 61 | 750.00 |
| 49 | 2016-08- | 2093 | කේ.එච්. චමින්ද , තිස්ස අර්ධකාලීන කඩ අංක 14 | 1,800.00 |
| 50 | 2017-07-06 | 8798 | රෝහණ පුෂ්පකුමාර , දෙබරවැව කඩ කාමර අංක 42 | 2,400.00 |
| 51 | 2017-08-11 | 8964 | එල්.වයි. මල්ලිකා දමයන්ති , දෙබරවැව කඩ කාමර අංක 15 | 1,800.00 |
| 52 | 2017-11-13 | 10564 | එච්.පී. සුමනාවතී , දෙබරවැව පො.වෙ.පො.අංක 03 | 2,400.00 |
| 53 | 2017-12-19 | 11345 | එච්.බී. රම්‍යා නිලන්ති , තිස්ස අර්ධකාලීන කඩ අංක 10 | 1,800.00 |
| 54 | 2017-12-19 | 11348 | එල්.ඒ.පී. අනුර , තිස්ස අර්ධකාලීන කඩ අංක 05 | 1,800.00 |
| 55 | 2017-12-15 | 11304 | එච්.ජී. රිසාන් ඉන්දික , දෙපරවැව පො.වෙ.පො. කඩ අංක 01 | 9,000.00 |
| 56 | 2017-12-16 | 11043 | එච්. වාසනා කුමාරි සුමනසේකර කිරින්ද පූජා නගර රථවාහන නැවතුම් කඩ කාමර අංක 34 | 900.00 |
| 57 | 2017-12-13 | 11037 | සී. සුරේකා දමයන්ති ,කිරින්ද පූජා නගර රථවාහන නැ.පො. අංක 20 | 900.00 |
| 58 | 2018-11-13 | 003717 | යූ.එච්. අමරාවතී | 1,500.00 |
| | | | එකතුව | **151,033.68** |

**විවිධ තැන්පත්**

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2016-05-10 | 20 | පළාත් පාලන කොමසාරිස් , දකුණු පළාත | 204,309.15 |
| 02 | 2018-08-22 | 1002330 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් , කෝපරේෂන් | 11,555.31 |
| 03 | 2018-08-24 | 22500 | කළමණාකරු,පීපල්ස් ඉන්ෂුවරන්ස් පුද්ගලික සමාගම | 6,050.00 |
| | | | | **221,914.46** |

**ආරක්ෂිත ඇප තැන්පත්**

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2016-05-05 | 481 | කාගිල්ස් ෆුඩ් කම්පැනි - 2016 වර්ෂයට කසළ ගාස්තු | 7,500.00 |
| 02 | 2016-09-14 | 2688 | සී/ස වයඹ ඇන්ඩ් පුද්ගලික සමාගම | 38,400.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | 2016-10-28 | 3536 | ඩබ්.ඒ. දිලුම් තාරක | 3,000.00 |
| 04 | 2017-11-03 | 10984 | එඡ්.පී. දිනේෂා මධුවන්ති | 880.00 |
| 05 | 2017-11-30 | 10988 | එච්.ඩබ්. ගුණපාල | 765.00 |
| 06 | 2018-12-31 | 4605 | බී.ඒ. මල්කාන්ති | 127,500.00 |
| 07 | 2017-05-25 | 7804 | රෙඩ් ලීඩ් මියුසික් ආයතනය | 50,000.00 |
| 08 | 2017.11.07 | 10476 | හික්කඩුව විතානගේ බර්ටි | 1,252.50 |
| 09 | 2017-11-07 | 10478 | නිශ්ශංක ඒකනායක බර්ටි , උස්වත්ත , මාලිංබඩ | 1,252.50 |
| | | | | **230,550.00** |

**10% රැදවුම් මුදල් තැන්පත් (කර්මාන්ත)**

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2017-01-26 | 5468 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 28,877.58 |
| | | | | **28,877.58** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

✓ මේ පිළිබඳ වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ගරු සභික, ආර්.ඒ. ගයාන් සදරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

ලේකම්තුමිය විසින් ප්‍රකාශ කරන ලද්දේ, 2017.03.15 සිට ටෙන්ඩර් ඇප තැන්පත් රු. 68,557.52 ක් වූ අයිතමයන් 32 ක මුදල් ද, 2011.08.11 සිට කඩ කුලී තැන්පත් රු. 151,033.68 ක් වූ අයිතමයන් 58 ක මුදල් ද, විවිධ තැන්පත් 2016.05.10 සිට රු. 221,914.46 ක් වූ අයිතමයන් 03 ක මුදල් ද, ආරක්ෂිත ඇප තැන්පත් 2016.05.05 සිට රු. 230,550.00 ක් වූ අයිතමයන් 09 ක මුදල් ද, 10% රැවුම් මුදල් තැන්පත් කර්මාන්තවල 2017.01.26 සිට රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ රු. 28,877.58 ක් වූ අයිතමයන් 01 ක මුදල ඇතුළුව මුළු මුදල් වසර 03 කට වඩා වැඩි කාලයක් වන නිසා, විගණන නිලධාරීන් විසින් දන්වන ලද්දේ මෙකී මුදල් සභා ආදායමට ගැනීමට කටයුතු කරන ලෙසයි.

✓ ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ගරු සභික, ආර්.ඒ. ගයාන් සදරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්ස මාළු වෙළඳසැලෙහි පිහිටි කඩ කාමර 18 සඳහා රු. 307,650.00 ක හිඟ ශේෂයක් අයවීමට ඇත. 2012 අගෝස්තු මස සභා තීරණයකට අනුව, 2012 සැප්තැම්බර් මස සිට බිල් කිරීම නවතා ඇති මෙම කඩ කාමරවල බදු ගිවිසුම අවලංගු වී ඇත්තේ 2006.12.31 දිනයි. ඒ අනුව, 2021.12.21 දින පැවති විගණන කළමනාකරණ කමිටුවේදී යෝජනා වූ පරිදි එම හිඟ කඩකුලිය සභා ආදායමින් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහතින් සඳහන් කරන ලද කඩ කාමර 2012 වර්ෂයේ සිට වසා දමා ඇති බැවින්, ඒ සඳහා වාර්තාවක් සහ ආදායම් පරීක්ෂක වාර්තාව සමඟ මේ සම්බන්ධයෙන් සාධාරණීකරණ වාර්තාවක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

❖ <u>**රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

- <u>**ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

04. 2021.12.31 දිනට අවසන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2021.02.21 දිනට අවසන් කර ඇති බැවින්, එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම 2022.03.31 දිනට අවසන් කිරීම සඳහා පහත සඳහන් පරිදි කමිටු සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

❖ <u>අපහරණ මණ්ඩලය</u>

| | | |
|---|---|---|
| **I.** | ගරු ප්‍රාදේශීය සභා සභික | - පී.කේ. ආරියසේන මහතා - (සාමාජික) |
| **II.** | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී | - කේ.ජී.එන්. ප්‍රමිලා නදීෂිකා මිය - (සභාපති) |
| **III.** | සංවර්ධන නිලධාරී | - ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනී මිය - (සාමාජික) |
| **IV.** | විමර්ශණ නිලධාරී | - ආර්.ඒ.එස්. ජානක මහතා - (සාමාජික) |
| **V.** | තාක්ෂණ සේවා නිලධාරී | - එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය - (සාමාජික) |
| **VI.** | සංවර්ධන නිලධාරී | - ඩබ්. ප්‍රියන්තිකා මිය - (සාමාජික) |

❖ <u>වෙන්දේසි මණ්ඩලය</u>

| | | |
|---|---|---|
| **I.** | ගරු ප්‍රාදේශීය සභා සභික | - ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා - (සාමාජික) |
| **II.** | විමර්ශණ නිලධාරී | - ආර්.ඒ.එස්. ජානක මහතා - (සාමාජික) |
| **III.** | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී | - කේ.ජී.එන්. ප්‍රමිලා නදීෂිකා මිය - (සාමාජික) |
| **IV.** | සංවර්ධන නිලධාරී | - එල්.පී. කල්පනී චමින්දිකා මිය - (සභාපති) |
| **V.** | තාක්ෂණ සේවා නිලධාරී | - එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය - (සාමාජික) |
| **VI.** | ආදායම් පරීක්ෂක | - එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මිය - (සාමාජික) |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

05. 2017 වර්ෂයේ දී ගිවිසුම්ගත වටිනාකම රු. 3,000,000.00 ක් වූ පහත සඳහන් කර්මාන්ත 03 ක් ගිවිසුම්කරුවන් විසින් අතහැර දමා තිබූ බැවින්, මෙම කොන්ත්‍රාත්කාර ආයතන අසාධු ලේඛනගත කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කර්මාන්තයේ නම | කොන්ත්‍රාත්කරු | ගිවිසුම් ගත දිනය | වටිනාකම |
|---|---|---|---|---|
| 01 | වීරහෙල දර්ශනගම පාර කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීම | නැදිගම්විල උතුරු ග්‍රාමීය සංවිධානය | 2017.11.01 | 1,000,000.00 |
| 02 | සඳගිරිගම බේකරිය අසලින් ඇති මාර්ගය සංවර්ධනය කිරීම | මහසෙන්පුර ගොවි සංවිධානය | 2017.11.01 | 1,000,000.00 |
| 03 | විජිතපුර ජී.ජී. සිරිපාල මහතාගේ නිවස අසල සිට ධර්මසේන මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | නැදිගම්විල වනජීවී ප්‍රජා සංවර්ධන සමිතිය | 2017.11.01 | 1,000,000.00 |
| | **මුළු එකතුව** | | | **3,000,000.00** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

06. පන්නෙගමුව පොළ භූමිය සංවර්ධනය කර ජනතාව වෙත ලබා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම්තුමා සහ ප්‍රධාන ලේකම්තුමා විසින් දන්වන ලද ලිපිය අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය සහ අවශ්‍ය මුදල් ලබා දෙන ලෙස ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙත සිදු කරන ලද ඉල්ලීමට අනුව, ඉදිරි මුද්දර ගාස්තුවලින් කපා හැරීමට යටත්ව, රු. 3,000,000.00 ක ප්‍රතිපාදන මුදලක් ලබා දුන් අතර, 2021.02.23 වන දින ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි, මෙම පොළ භූමිය ජනතා අයිතියට පත් කිරීම සඳහා උපදෙස් ලැබී තිබු බැවින්, ඇස්තමේන්තු සකස් කර මහා සභා අනුමැතිය යටතේ මෙම පොළ භූමියේ වැඩ කටයුතු ආරම්භ කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ආරම්භ කර ඇත. ඊට අදාළව පළමු අදියර යටතේ රු. 1,602,910.00 ක ඇස්තමේන්තුව සහ දෙවන අදියර යටතේ රු. 1,797,910.00 ක ඇස්තමේන්තුව මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. පන්නෙගමුව තොග පොළ භූමිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව පළමු අදියර යටතේ සකස් කරන ලද ඇස්තමේන්තුවට අදාළ ද්‍රව්‍ය ලැයිස්තුව සහ දෙවන අදියර යටතේ සකස් කරන ලද ඇස්තමේන්තුවට අදාළ ද්‍රව්‍ය ලැයිස්තුව මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>පළමු අදියරේ ඇස්තමේන්තුව - (රු. 1,602,910.00)</u>

- Cement (50 kg Bag) - 32
- Sand – Cube - 01
- Metal ¾ - Cube - 02
- ABC Mixture – Cube - 03
- 30 (30 N / MN2) Uni Colour inter Nr Locking Concrete Block - 17630
- Quarry Dust – Cube - 08
- 9'' Height Steel Plate (Rent) L.ft - 510

<u>දෙවන අදියරේ ඇස්තමේන්තුව - (රු. 1,797,910.00)</u>

- Cement (50 kg Bag) - 32
- Sand – Cube - 01
- Metal ¾ - Cube - 02
- ABC Mixture – Cube - 03
- 30 (30 N / MN2) Uni Colour inter Nr Locking Concrete Block - 17630
- Quarry Dust – Cube - 08
- 9'' Height Steel Plate (Rent) L.ft - 510

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය වටා විදුලි කණු ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. 1,526,140.00 කින් යුත් සංශෝධිත ඇස්තමේන්තුව සහ සංශෝධිත ද්‍රව්‍ය ලැයිස්තුව නිර්දේශ ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- 2’’ x 2’’ x ¼’’ L බාර් - 10
- 2’’ Ø GI බට (1.8 mm) - 02
- ½’’ Ø 1 ½ යකඩ ඇණ (වොෂර් සමඟ) Nut abast - 20
- ½’’ Ø GI 6mm බට - 01
- සිමෙන්ති - 60 Bag
- ¾ ගල් - 04 Cube
- වැලි - 04 Cube
- අඩි 100 දිග කඹ - 04

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>**

09. මාගම අක්කර 18 හන්දිය සිට මෝදරපැලැස්ස හරහා කිරින්ද විහාරස්ථානය දක්වා මාර්ගය මේ වන විට සංවර්ධනය කර කාපට් අතුරා අවසන් අදියරෙහි පවතින අතර, මෙම සංවර්ධන කටයුත්තේ අවසානය කිරින්ද විහාරස්ථානය දක්වා මාර්ගය සංවර්ධනය සිදු නොකර ඇත. කිරින්ද විහාරස්ථානය ඓතිහාසික වටිනාකමකින් යුත් රජමහා විහාරස්ථානයක් වන අතර, දෙස් විදෙස් සංචාරකයින් විශාල ප්‍රමාණයක් මෙම විහාරස්ථානය වැද පුදා ගැනීමට පැමිණෙන බැවින්, කඩිනමින් විහාරස්ථානය දක්වා ඉතිරි කොටස කාපට් අතුරා සංවර්ධනය කර දෙන මෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුතුමා (ප්‍රධාන) වෙත ලිඛිතව දන්වා යැවීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

මාගම අක්කර 18 හන්දියේ සිට මෝදරපැලැස්ස හරහා කිරින්ද විහාරය දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජිතව තිබුණද, එකී මාර්ගය විහාරස්ථානය දක්වා සංවර්ධනය සිදු නොකර ඇති අතර, විහාරස්ථානය දක්වා මාර්ගය සකස් කිරීමට තවත් මීටර් 300 ක ප්‍රමාණයක් ඇති බවත් ප්‍රකාශ කරන ලදී. කිරින්ද විහාරස්ථානය ඓතිහාසික විහාරස්ථානයකි. විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේද මෙම මාර්ගය විහාරස්ථානය දක්වා සංවර්ධනය කර දෙන ලෙසට ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගෙන්, ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගෙන්, ගරු සභාපතිතුමාගෙන් සහ අප වෙතින් ඉල්ලීම් කරනු ලබයි. මෙකී කරුණු සම්බන්ධයෙන් ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා මාර්ග සංවර්ධන අධිකාරිය වෙතද උපදෙස් ලබා දී ඇත්තේ මෙකී මාර්ගයේ සංවර්ධන කටයුතු කිරින්ද විහාරස්ථානය දක්වා සංවර්ධනය කරන ලෙසයි. නමුත් මෙකී කාර්යය මෙතෙක් සිදු නොවී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. කිරින්ද වෙරළ උද්‍යාන රථවාහන නැවතුම්පොළට යන මාර්ගය ද විහාරස්ථාන මාර්ගය හා සම්බන්ධ වෙමින් පවතින අතර, විහාරස්ථානයේ සිට මීටර් 500 පමණ දුරක් සංවර්ධනය කර ගැනීමට තිබෙන බැවින්, මාගම අක්කර 18 හන්දියේ සිට මෝදරපැලැස්ස හරහා කිරින්ද විහාරය දක්වා මාර්ගයේ සංවර්ධන කිරීමේ වැඩ අංක MOR/RDA/LBRRC/MNRCE/SP/HMB/2020/63 යටතේ වෙන් කරන ලද මුදල් ඉතිරි වී ඇති බැවින්, මෙම ඉතිරි මුදල් යෙදවා මෙම සංවර්ධන කටයුත්ත නිම කර

දෙන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

මාගම අක්කර 18 හන්දියේ සිට කිරින්ද විහාරය දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට අදාළ කටයුතු සඳහා මැදිහත්වීමක් ලබා දීම වෙනුවෙන් ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා වෙත තම ගෞරවණීය ස්තුතිය පුද කරන ලදී. තවද, මෙකී මාර්ගය දීර්ඝ කර දෙන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලද ලිපියේ පිටපත් කිරින්ද විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ වෙත සහ ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා වෙත පිටපත් යොමු කරන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.03.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.03.09 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.03.09 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.03.09 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (ඖ) වෙනත් කරුණු

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහත්මියගේ අදහස් දැක්වීම</u>

බෝධි මහා විහාරය අසල තිබූ විදුලි කණුව ගැලවීම නිසා එහි තිබූ විථි පහනට කුමක් සිදු වී ඇත්ද යන්න සොයා බලන ලෙසට පසුගිය මහා සභා වාරයකදී තමා විසින් දන්වන ලදී. එකී විථි පහන සම්බන්ධයෙන් විෂය නිලධාරී විසින් සොයා බලා ඇති බවත්, එම විථි පහන අද දින සභාවට ලැබෙන බවට කරුණු දැන ගැනීමට ලැබුණු බැවින්, එය අද දිනම සවි කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී. මේ සම්බන්ධයෙන් සොයා බලා අදාළ කටයුතු සිදු කළ විෂය නිලධාරී වෙත ස්තුතිය පුද කරන ලදී.

යෝධකණ්ඩිය කොට්ඨාසයේ වැලිපොතේවල දහම් මාවත මාර්ගයේ තිබෙන පෞද්ගලික ඉඩමක වර්ෂා කාලයේ දී වතුර බැස්සවිය නොහැකි ලෙසට ඉඩමක් ජලයෙන් යටවන නිසා, එම ස්ථානය සඳහා බෝක්කුවක් ලබා දෙන ලෙසට 2021 දෙසැම්බර් මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කර එය සම්මත වුවත්, තවමත් එකී යෝජනාව ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ බැවින්, එකී බෝක්කුව කඩිනමින් සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>බෝධි මහා විහාරය අසල ගලවා ඉවත් කරන ලද කණුවේ තිබූ විථි පහන අද දිනම සවි කර දෙන ලෙසට දන්වා සිටින ලදී.</u>

<u>එසේම රටේ ඇති වී තිබෙන විදුලි අර්බුධයත් සමඟ වැව් කණ්ඩිවල විථි පහන් රාත්‍රී 10.00 වන විට නිමා දැමීමට සභාවේ සේවකයෙකු යොදවා ඇත. මෙලෙසට ගම්මානවලද සවි කර ඇති විථි පහන් නිමා දැමීම සිදු කරන ලෙසට ගරු සභිකයින් මගින් ජනතාව දැනුවත් කිරීම සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.</u>

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. චාලි ගුණරත්න මහතා</u>

තිස්සමහාරාම බල ප්‍රදේශයේ ගම්මානවල, ඇතැම් පොදු ස්ථානවල ආදී ස්ථානයන්හි අනතුරු බහුල වශයෙන් සිදු වනවා සහ අන්ධකාරයේ පවතී යනුවෙන් ප්‍රකාශ කර, ජනතාව විසින් එකී ස්ථාන සඳහා විථි පහන් ලබා ගැනීම් සිදු කළද, පාන්දර වූ පසුව ඒවා නිමා දැමීම කිසිදු කෙනෙකු විසින් සිදු නොකරයි. එම නිසා පාන්දර වන විට නිමා නොදමන විථි පහන් ගලවා ඉවත් කරනවා යනුවෙන් ප්‍රචාරනයක් ලබා දී ජනතාව දැනුවත් කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

මේ වන විට රටේ පවතින විදුලි අර්බුධය නිසා අලුතින් විථි පහන් සවි කිරීම තාවකාලිකව නවතා දැමීම සුදුසුය. තමා හට ද විථි පහන් කිහිපයක් සවි කිරීමට තිබුණද මෙකී ගැටළුව නිසා එය තාවකාලිකව නතර කළද, යාබඳ කොට්ඨාසයන්හි විථි පහන් සවි කිරීම නිසා තම කොට්ඨාසයේ ජනතාව තමා වෙත දෝෂාරෝපණ සිදු කරනු ලබයි. එම නිසා සියලුම කොට්ඨාසයන්හි අලුතින් විථි පහන් සවි කිරීම තාවකාලිකව නතර කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

එසේම මහජන නියෝජිතයින් ලෙස බුද්ධිමත්ව සිතා බලා මේ අවස්ථාවේ රටේ උද්ගත වී ඇති විදුලි අර්බුධය ගැන සිතා විථි පහන් සවි කිරීමට අදාළ කටයුතු සිදු කළ යුතුය.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ අදහස් දැක්වීම</u>

රට තුළ විදුලි අර්බුධය මේ දිනවල තිබුණත්, අත්‍යාවශ්‍යම අවස්ථාවක් මතු වුවහොත් විථී පහන් සවි කිරීම කළ යුතුය. තම කොට්ඨාසයේ සවි කිරීම සඳහා තමා සතුවද විථී පහන් 25 ක් තිබේ. එම විථී පහන් සවි කිරීම සඳහා මීට පෙර වයර් ලබා දෙන ලෙසට ඉල්ලීම් කළද, රටේ පවතින විදුලි අර්බුධය විසඳු පසුව එකී විථී පහන් සවි කිරීම සඳහා අවශ්‍ය වයර් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

නැදිගම්විල මහනැගුම පාළම අසල තිබෙන අනතුරුදායක තත්ත්වය සහ සිදුවන වංචනික ක්‍රියා නතර කරලීම සඳහා එම ස්ථානයට විථී පහන් 02 ක් ලබා දෙන ලෙසට කිහිප අවස්ථාවකදීම මහා සභාවෙන් ඉල්ලීම් කළද එය මෙතෙක් ලබා ගැනීමට නොහැකි වී ඇති බැවින්, එම ස්ථානයට කඩිනමින් විථී පහන් 02 ක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

වර්ෂාවත් සමඟ කොට්ඨාසයේ පවතින මාර්ගවල ගමන් කිරීමට නොහැකි බැවින්, එකී මාර්ග මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

කිලෝ මීටර් 100,000 මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ තම කොට්ඨාසයේ මාර්ගයක මේ වන විට ABC යොදා තිබීම නිසා මාර්ගයේ වළවල් හෑරී ඇති බැවින් අනතුරු සිදු වේ. එම නිසා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර කඩිනමින් මෙම මාර්ගයේ කාපට් අතුරා දෙන ලෙසට ඉල්ලීම් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

නැදිගම්විල විහාරස්ථානයට යන මාර්ගයේ ජලය අවහිර වී මාර්ගය කැඩී යන අවස්ථාවක ජනතාවගේ ඉල්ලීමක් අනුව, රාජ්‍ය නිලධාරීන්ද ඒ සඳහා අදාළ කටයුතු සිදු කළ බවත්, දේශපාලන අංශයෙන් ගරු සභාපතිතුමා මැදිහත් වී එකී මාර්ගය සකස් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් තම කොට්ඨාසයේ ජනතාව ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කළ බව දන්වා සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>

පසුගිය දිනක මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ප්‍රාදේශීය සභාවේ පැවැති සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස අලුතින් සකස් කර ඇති මාර්ග සහ මාර්ගවල අඩුපාඩු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී, ඒ අනුව, කතරගම ප්‍රධාන මාර්ගයේ සිට ටිකිරවැව ගොඩාන දක්වා දිවෙන අතුරු මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ දී ප්‍රධාන මාර්ගයත් අතුරු මාර්ගයත් අතර RDA සීමාව සංවර්ධනය වී නොතිබූ බැවින්, එම කොටස එකී සාකච්ඡාව හරහා සංවර්ධනය කර ගැනීමට හැකි විය. ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාටත්, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුතුමා ඇතුළු නිලධාරීන්ටත් ස්තූතිය පුද කරන ලදී.

අප බල ප්‍රදේශය තුළද දිනෙන් දින සොර සතුරන් වැඩ වේ. ඉදිරියේ එළඹෙන සිංහල අලුත් අවුරුදු උත්සව සමයත් සමඟ මෙවැනි සොර සතුරන් විශාල වශයෙන් වැඩි විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී ව්‍යාපාර මංකොල්ලකෑම්, රත්රන් බඩු කඩා ගැනීම්, වාහන සොරකම් කිරීම්, මුදල් සොරා ගැනීම් ආදිය බහුල වශයෙන් සිදු විය හැකිය. එම නිසා තිස්සමහාරාමයේ ජනතාව මෙම සොරුන්ගෙන් බේරා ගැනීම සඳහා පොලිස් ස්ථාන දැනුවත් කර, එළඹෙන උත්සව සමයට නගරය සඳහා පොලිස් ආරක්ෂාව ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

විදුලි බල මණ්ඩලය මගින් ගස්වල අතු ඉති කපා මාර්ගයන් දෙපස දමා යෑම් සිදු කරන බවට මහා සභා කිහිපයකදීම තමා විසින් ප්‍රකාශ කරන ලදී. සංචාරකයින් බහුල සිටින තම කොට්ඨාසයේ සංචාරකයින් පයින් සංචාරය කිරීමේ දී මෙමගින් ඔවුන් දැඩි අපහසුතාවයන්ට පත් වීමට සිදු වේ. විදුලි බල මණ්ඩලය දැනුවත් කර සභාව මගින් ලිපි යොමු කළත්, එකී කටයුත්ත මේ වන තෙක්ම

නිසි ක්‍රමවේදයකට අනුව සිදු නොවේ. එම නිසා මෙකී කටයුත්ත මේ වන විටත් කිසිදු ක්‍රමවේදයක් නොමැතිව අවිධිමත්ව සිදුවන බවට දන්වා නැවතත් විදුලි බල මණ්ඩලය වෙත ලිපියක් යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>එළඹෙන උත්සව සමයත් සමඟ තිස්සමහාරාමයේ ජනතාව සොර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා, වැඩපිළිවෙලක් සකස් කිරීමට පොලිස් ස්ථාන සමඟ සාකච්ඡාවක් ලබා ගැනීමට තීරණය විය.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම</u>

මේ වන විට ප්‍රදේශයේ වී අස්වනු නෙලීම ආරම්භ වී ඇත. මෙම වී වගාව මෙම කන්නයේ පොහොර නොමැති හේතුව නිසා ඉතාමක් බාධක මැද සිදු කරන ලද්දකි. එසේ බාධක මැද සිදු කරන ලද වී වගාවේ අස්වනු නෙලීම සඳහා අවශ්‍ය කරන ඉන්ධන නොමැතිකම නිසා තවත් ගැටළු සහගත වී ඇත. එම නිසා තිස්සමහාරාම ප්‍රදේශයේ ජනතාවගේ වී අස්වනු නෙලීම සඳහා අවශ්‍ය කරන ඉන්ධන ලබා දීම සම්බන්ධයෙන් පහසුකම් ලබා දෙන ලෙසට අදාළ බලධාරීන් දැනුවත් කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ව්‍යාපාර කාර්යාල මැදිහත් වී යල් කන්නය සඳහා කුඹුරු වගාවට ජලය ලබා දීමට කටයුතු සැලසුම් කරයි. නමුත් කුඹුරු වගාව සඳහා ජලය ලබා දීම සම්බන්ධයෙන් වම් ඉවුරෙන් ප්‍රතික්ෂේප කර ඇති බව දැන ගැනීමට ලැබුණි. ලබන කන්නයේ සම්පූර්ණයෙන්ම රසායනික පොහොර නොමැතිව, කාබනික පොහොර පමණක් භාවිතා කර වී වගාවන් සිදු කිරීමට සිදුව ඇත. මෙම කන්නය තුළ ඇතැම් අයවලුන් ළඟ තබා ගත් රසායනික පොහොර භාවිතා කළද, ලබන කන්නය වන විට කිසිසේත්ම රසායනික පොහොර නොමැතිව කාබනික පොහොර පමණක්ම යොදා වී වගාවන් සිදු කිරීමට සිදු වේ. එම නිසා මේ සම්බන්ධයෙන් අදාළ අංශ, ආයතන සමඟ සාකච්ඡා කර වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

ඉදිරි කන්නයේදී කුඹුරු වගාව සඳහා අවශ්‍ය කරන පොහොර ලබා දෙන ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා සිදු කළද, එකී සාකච්ඡාවන්හි ද ප්‍රතිඵලය වන්නේ කුඹුරු වගාව සඳහා කාබනික පොහොර ලබා දීමයි. කුමන සාකච්ඡා සිදු කළත් රසායනික පොහොර නොමැතිව වී වගාවෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගත නොහැකිය. අස්වැන්න වැඩි මුදලකට ගත්තද අස්වැන්න අඩු නම් එය සාර්ථක නොවේ. රට තුළ මේ වන විට ආහාර හිඟයක් ද පවතී. මෙකී තත්ත්වය තුල රට ගොඩනැගීමට නම් ගොවියා අනිවාර්යයෙන්ම වගා කළ යුතුය. එම නිසා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර කාබනික පොහොර සඳහා සැලසුම් සකස් කර ගන්නා තෙක්, වී වගාවන් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කරන පොහොර ලබා දෙන ලෙසට ඉල්ලීම් කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ වී අස්වැන්න හිඟ වීමත් සමඟ ඉදිරියේ දී හාල් මිල ඇඩි ලෙස ඉහල යාමක් සිදු විය හැකිය. මෙලෙසට හාල් මිල ඉහල යාම රට තුළ සිදුවන ඉතාමත් භයානක තත්ත්වයකි. එම නිසා මෙකී තත්ත්වය අවම කිරීම සඳහා වී අස්වැන්න සඳහා අවශ්‍ය කරන පොහොර ලබා දී ගොවි ජනතාවගේ වගාවන් රැක ගැනීමට කටයුතු කළ යුතුය.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉදිරි කන්නයන්හි කුඹුරු වගාවන් සිදු කිරීමට අවශ්‍ය පොහොර ලබා දීම සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමා සහ ඉංජිනේරුතුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය</u>

ලේකම්තුමිය, කෘෂිකර්ම අධ්‍යක්ෂකතුමා, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ DO නිලධාරීන් දෙදෙනා ඇතුළු සියලුම ගරු සභිකයින් එක්ව කඩිනමින් සාකච්ඡාවක් ලබා ගැනීමට තීරණය විය.

- **ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම**

තිස්සමහාරාම මහජන පුස්තකාලයේ අඩුපාඩු සම්බන්ධයෙන් පසුගිය පුවත්පතක පුවතක් පල වී ඇති බවට කරුණු දැන ගැනීමට ලැබුණි. තම පවුලේ සාමාජිකයින් 04 දෙනාම මෙම පුස්තකාලයේ සාමාජිකයින් වී තිබේ. 2010 සිටම අපට අවශ්‍ය පොත්පත් සියල්ල කියවීම සඳහා ලබා ගන්නා ලද්දේ මෙම පුස්තකාලයෙනි. තිස්සමහාරාමයේ උපාධිය හදාරන සිසුන් සඳහා අවශ්‍ය කරන සියලුම පොත් මෙහි තිබෙනු ඇත. එම නිසා තිස්සමහාරාම මහජන පුස්තකාලයේ අඩුපාඩු තිබෙනවා යනුවෙන් සඳහන් කර ඇති පුවත දීර්ඝ කාලයක් පුස්තකාලය භාවිතා කරන තමා පිළිනොගන්නා කරුණක් බව සඳහන් කරන ලදී.

යෝධකණ්ඩිය ශ්‍රී දේවානන්ද මහා විද්‍යාලයට වසර 73 ක් පිරීම නිමි කර ගෙන මාපිය වන්දනා වැඩසටහනක් සිදු කිරීමට කටයුතු කරන ලදී. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා පොලිස් ආරක්ෂාව ලබා දීමට මැදිහත් වූ ගරු සභාපතිතුමාටත්, පොලිස් නිලධාරීන්ටත් ස්තූතිය පුද කරන ලදී.

තමා මේ දක්වාම මහා සභාවේ පෙනී සිට තිස්සමහාරාමයේ වැව් රක්ෂිත අල්ලා ගැනීම්, විදුලි වැට ඉදිකිරීම, ගම්වදින වන අලි ගැටළුව, මාර්ග රක්ෂිත අල්ලා වැටවල් ගැසීම් ආදිය පිළිබඳ දිගින් දිගටම අදහස් දක්වන ලදී. නමුත් උඩස්ගම පළතුරු කඩය එම ස්ථානයෙන් ඉවත් කිරීමට තමා මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවට එක් දිනක එම ස්ථානයට තමා ගිය පසුව ප්‍රකාශ කරන ලදී. මා පෙනී සිටි කිසිදු මහා සභාවකදී ඉහත කී ගැටළු සම්බන්ධයෙන් අදහස් දැක්වූවා මිසක, මෙකී පළතුරු කඩය ඉවත් කිරීම සම්බන්ධයෙන් කිසිදු යෝජනාවක් තමා ඉදිරිපත් කර නොමැති බව අද දින ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම, යෝධකණ්ඩිය ප්‍රදේශවල මේ දිනවල වී අස්වනු නෙලීම ආරම්භ කර ඇත. එම ප්‍රදේශයේ එක් පුද්ගලයකු කාබනික වගාවන් සිදු කර හොඳ අස්වැන්නක් ලබා ගැනීමට හැකි බවට වී වගාව ආරම්භයේ ප්‍රකාශ කරන ලද මුත්, එම වගාවේ අස්වනු නෙලීමෙන් පසු අස්වනු බොහෝ අඩු වී ඇති බව සඳහන් කරන ලදී. මෙකී කරුණු එසේ ගත් කළ කාබනික පොහොර යෙදීමෙන් පෙර තිබූ පරිදි වී අස්වැන්නක් ලබා ගැනීමට නොහැකිය. වී වගාව ආරම්භයේ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ කාබනික පොහොරවලින් වී වගාවන් සිදු කර, වී අස්වැන්න අඩුවුවහොත් හෙක්ටයාරයකට රු. 50,000.00 ක වන්දි මුදලක් ලබා දෙන බවයි. නමුත් මේ සම්බන්ධයෙන් නිලධාරීන් කිසිදු දැනුවත්භාවයක් නොමැති බැවින්, මේ පිළිබඳ සොයා බලා ගොවි ජනතාවට සාධාරණයක් ඉටු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

විදුලි වැට ඉදිකිරීමේ කටයුතු කොපමන කතා කළත් මෙතෙක් විසඳා ගැනීමට නොහැකි වී ඇත. පසුගිය දිනක උද්ධක්නදර විහාරස්ථානයේ මේ සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවකදී අප වෙත දෝෂාරෝපනයක් එල්ල වී ඇත්තේ මෙකී විදුලි වැට සකස් කිරීමත් සිදු නොකර එකී කාර්යය කඩාකප්පල් කරනාවා යනුවෙන්. එම නිසා මේ සම්බන්ධයෙන් ගනු ලබන සාකච්ඡාව කඩිනමින් ලබා ගෙන, මේ සඳහා කඩිනම් විසඳුමක් ලබා ගත යුතුය. නැතහොත් එම දෝෂාරෝපණය අප සියලුම දෙනා වෙතම එල්ල වනු ඇත.

ප්‍රදේශයන්හි මාර්ග රක්ෂිත අල්ලා ඉඩම්වල වැටවල් ගැසීම් සම්බන්ධයෙන් සොයා බලා, ඊට අදාළ කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>උඩස්ගම හන්දියේ තිබෙන පළතුරු කඩය ඉවත් කිරීම ප්‍රාදේශීය සභාවෙන් සිදු නොකල බවත්, එය මාර්ග රක්ෂිතයේ ඉදි කර ඇති නිසා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඉවත් කිරීමට කටයුතු කර ඇති බවත් සඳහන් කරන ලදී.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ අදහස් දැක්වීම</u>**

මේ වන විට කුඹුරුවල වී අස්වනු නෙලීම ආරම්භ වී ඇත. මාගම යෝධකණ්ඩිය වැවේ වළදොර මගින් කුඹුරු කරන කුඹුරුවලද වී අස්වනු නෙලීම ආරම්භ වී ඇත. තිස්සමහාරාම ප්‍රදේශයේ ද ධනවතුන් ළඟ රසායනික පොහොර තිබූ නිසා රසායනික පොහොර යොදා වී වගාවන් සිදු කර අස්වනු සාර්ථක ලෙස ලබා ගත හැකි වුවද, අසරණ ගොවි ජනතාවට පොහොර නොමැතිකම නිසා කාබනික පොහොරවලින් වී වගාවන් සිදු කර අස්වනු නෙලීමෙදී බොහෝ සේ අස්වනු අඩු වීමක් සිදු වී ඇති බව දැක ගැනීමට හැකි විය. පසුගිය කාලයේ වී අස්වැන්න සඳහා සාධාරණ මිලක් නොතිබුණද, මේ වන විට වී අස්වැන්න අඩු වුවත් ඒ සඳහා යම් මිලක් ලැබී ඇති බව ප්‍රකාශ කරන ලදී.

ඉදිරි කන්නයේදී වී වගාවන් ආරම්භ කිරීමට පෙර මෙම වී වගාවේ වල්පැළ විනාශ කර දැමීමට යම් විසඳුමක් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර ලබා ගත යුතුය. මෙම කන්නය තුළ වෙළඳසැල් වලින් ඉතා අධික මුදලට කෘමිනාෂක ලබා ගනිමින් වල් මර්ධනය කර ගත්තද, ඊළඟ කන්නය සඳහා වල්පැළ විනාශ කර ගැනීම සඳහා කෘමිනාෂක ලබා ගැනීම කළ යුතුය. මේ සම්බන්ධයෙන් උපදෙසක් ලබා දීමට රාජ්‍ය නිලධාරීන්ටද නොහැකි වී ඇත. එම නිසා ඊළඟ කන්නයේ වී වගාව ආරම්භ කිරීමට පෙර මෙකී ගැටළු ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා හෝ රාජ්‍ය අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර විසඳා ගැනීමට කටයුතු කළ යුතුය.

විදුලි වැට ඉදිකිරීමේ කටයුතු මෙතෙක් සිදු වී නොමැත. මෙකී කටයුතු ප්‍රමාද කිරීම නිලධාරීන් විසින් සිදු කරන ලද දෙයකි. අසරණ ගොවි ජනතාව ඉතාමත් දුක්ඛිතව සිදු කරන ලද වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා මාගම මෝදරපැලැස්ස ප්‍රදේශයේ විදුලි වැට ඉදි කිරීමට අවශ්‍ය අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, එල්.එච්. කුමුදු සුජීව මහතාගේ අදහස් දැක්වීම</u>**

පක්ෂ විපක්ෂ සියලුම දෙනා දක්වන ලද මැසිවිලි අද දින ඇසීමට ලැබුණි. මේ වන විට රට තුළ ඉන්ධන, ගෑස්, නිවසට අවශ්‍ය බඩු ලබා ගැනීම සඳහා ජනතාව පෝලිම්වල සිටීම නිසා දැඩි අසරණ තත්ත්වයකට පත්ව ඇත. 1948 වර්ෂයේදී ඩොලරයට රු. 01.00 ක් ගෙවීමට තිබූ හැකියාව අද වන විට ඩොලරයට රු. 275.00 ක් ගෙවීමට සිදුවන ලෙසට ආර්ථිකය බිඳ වැටී ඇත. මෙය ස්වභාවිකව සිදු වූ දෙයක් නොවන බවත්, 1948 සිට රට පාලනය කළ අදූරදර්ශි පාලනය විසින් නිර්මාණය කරන ලද වටපිටාවකි. 1948 සුද්දා අප රට අත්හැර යද්දි ඩොරයට රු. 01.00 ගෙව්වා නම් එය අද රු. 275.00 ලෙස ගෙවීම සිදු වන්නේ රට තුල වැටුණු ආර්ථික අවපාතය උද්දමනයට වගකිව යුත්තේ 1948 දී පාලනය කළ සියලු පාලකයන්ය. 1948 සිට 1978 වන තෙක් අප රටේ පාර්ලිමේන්තුව පාලනය කළ පාලකයන් එහි ගෞරවය රැක ගැනීම සඳහා දේශපාලනය කරන ලදී. නමුත් 1978 පසුව දේශපාලනයට පැමිණි නායකයින් තමන් වෙත ව්‍යාපාර දියුණු කර ගැනීමේ අරමුණින් පැමිණි දේශපාලන නායකයින් ලෙස දැක්විය හැකිය.

මෙම කන්නයේ කුඹුරු වගාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය කරන පොහොර ජනතාව විසින් ලබා ගන්නා ලද්දේ ඉතා අධික මිලකටය. ඇතැම් ගොවියන්ට එසේ අධික මුදලට හෝ ගැනීමට පොහොර නොමැති විය. එසේ බාධක මැද සිදු කරන ලද වී වගාවේ වී මිල ඉහල දැමීම ගොවි

ජනතාවට සතුටක් වුවද, ඒ හා සමානව හාල් මිල ඉහල යාම පාරිභෝගික ජනතාවට දරා ගත නොහැකි කරුණක් වනු ඇත.

ලෝකයට ඥානය දෙන මිනිසුන් බොහෝ පිරිසක් සිටින්නේ අප රට තුළයි. එසේ ලෝකයට ඥානය දෙන අප රටේ මිනිසුන් අද වන විට දැඩි අසරණ තත්ත්වයකට පත්ව ඇත. එම නිසා අප රට ගොඩ නැගීමට අප සියලුම දෙනා එකට එක්ව කටයුතු කළ යුතුය. අප අපගේ දරුවන්ට මේ මහා පොළවේ ජීවත් විය හැකි ආකාරයට රට රැක ගැනීමට කළ හැකි දේ උපරිමයෙන් කළ යුතුය.

දෙබරවැව ක්‍රීඩාංගනයේ අඩුපාඩු කිහිපයක් සකස් කිරීමට තිබේ. තිස්සමහාරාමයේ දරුවන් ක්‍රීඩා පුහුණුවීම් සිදු කරනු ලබන්නේ මෙම ක්‍රීඩාංගනයේය. රටට දක්ෂ ක්‍රීඩකයින් බිහි වී ඇත්තේ මෙම ක්‍රීඩාංගනයේ පුහුණුවීම් ලබමින් නිසා, අප දරුවන්ගේ ක්‍රීඩා කෞෂලතා වර්ධනය කර ගැනීම සඳහා ක්‍රීඩා පුහුණුවීම් කටයුතු සිදු කිරීමට ඇති මෙම ක්‍රීඩාංගනයේ අඩුපාඩු කඩිනමින් නිවැරදි කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

ඉදිරි උත්සව සමයත් සමඟ සොර සතුරු කරදරය වැඩි විය හැකිය. අප සමාජයේ ජනතාව මෙම සොර සතුරන්ගෙන් බේරා ගැනීමට පාට පක්ෂ භේද නොබලා එකට එක්ව කටයුතු කළ යුතුය. උත්සව සමයේ ඉදිරියේදී ඇති විය හැකි අවධානම සඳහා වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

මේ වන විට සිදු කරන ලද කුඹුරු වගාවන්හි අස්වනු නෙලීම ආරම්භ කර ඇති බැවින්, වී අස්වනු නෙලීම සඳහා අවශ්‍ය කරන ඉන්ධන ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම</u>**

අප රට තුළ මේ වන විට ඛේදවාචක තත්ත්වයක් උදා වී ඇත. රට තුළ තිබෙන ආර්ථික තත්ත්වය රට ගොඩනැගීමට තිබෙන උත්තරයක් නොවේ. රට ගොඩ නැගීමට නම් නිෂ්පාදන ධාරිතාවය, ඒක පුද්ගල ආදායම වැඩි කර ගත යුතුය. සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය, කොරෝනා වසංගත තත්ත්වයන්ම රට තුළ ආදායම් තත්ත්වය අඩු වීමට බලපෑමක් නොවේ. මෙකී කරුණු ද ආදායම බිඳ වැටීමට එක් සාධකයකි. මෙකී කරුණුත් සමඟ තවත් බොහෝ කරුණු එකතු වී රටට මෙම මහා ව්‍යවසනය සිදු වී ඇත. අප මේ සඳහා එක් එක් අංශයන් වෙත ඇඟිලි දික් නොකර, රට ගොඩ නැගීමට එක්ව කටයුතු කළ යුතුය. පාට පක්ෂ නොබලා එක්ව එක්ව අනාගත පරපුර ආරක්ෂා කර ගැනීම සඳහා ලබා ගත යුතු තීරණ පිලිබඳ කතිකා කර ගනිමින් ඒවා නිවැරදිව ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතුය.

රජයට පැමිණෙන විවිධ ආණ්ඩු විසින් දේශපාලනීකරණය කර ගනිමින් ගම තුළ ප්‍රජා ශාලා/ වෙනත් ගොඩනැගිලි ඉදි කර ඇත. එම කුමන ගොඩනැගිල්ලක් ඉදි කළද එම ස්ථාන 02 න්ම වෙන්නේ ගමේ ජනතාව එකට එක්ව සාකච්ඡා කිරීමේ ක්‍රියාවන්ය. මෙවැනි දේ සිදු වූයේ සෑම දෙයක්ම දේශපාලනීකරණය වූ නිසාය. නමුත් රටේ ආර්ථිකය දේශපාලනීකරණය නොවී ජාතික සැලසුමක් ආර්ථිකයට තිබිය යුතුය. සුද්දගේ පාලන කාලයේ අප රටට යටත් වීමට සිදු වූයේ අප රටේ අවාසනාවන්ත එකමුතුකම නොමැති වීම නිසාය. එම නිසා අප රටේ ආර්ථිකය ගොඩනැගීමට නිවැරදි දේ සියලුම දෙනා එක්ව කතිකා කර ගනිමින් නිවැරදිව ක්‍රියාවට නැංවිය යුතුය. අප රට තුළ ආර්ථිකය ගොඩනැගීම නම් ඩොලරය සේම, නිෂ්පාදන ධාරිතාවයද වැඩි කළ යුතුය. අප රට තුළ පවතින සියලු දේශපාලන පක්ෂ එකට එකතු වී කටයුතු කළ යුතුය. බෙදී වෙන් වී සිටිනතාක් අප අනාගත දරු පරපුර සඳහා සෙතක් සිදු කළ නොහැකි වනු ඇත. පාට පක්ෂ භේදයකින් තොරව කටයුතු කිරීමේ පූර්වාදර්ශය අප සභාවෙන් රටටම ආදර්ශය ලබා දී ඇත. විපක්ෂයක් ලෙස අප

ආණ්ඩු පක්ෂය සඳහා සහාය ලබා දීම සම්බනධයෙන් ඇතැම් දේශපාලන නායකයින්, පුද්ගලයින් අප වෙත දෝෂාරෝපණ එල්ල කරනු ලැබූ අවස්ථාවන් අපමණය. නමුත් තමා ප්‍රදේශයේ ජනතාවට සේවයක් කිරීම පිණිස එලෙස ආණ්ඩු පක්ෂයට සහාය ලබා දී කටයුතු කරනු ලබයි. තමා නිරන්තරයෙන්ම ජනතා සේවය කරන මහජන නියෝජිතයෙක් ලෙස පෙන්වා දිය හැකිය.

කෘෂිකාර්මාන්තය නඟාසිටුවීමට, අනාගත පරපුර සුරක්ෂිත කිරීම සඳහා රසායනික පොහොර, ද්‍රව්‍ය භාවිතය නතර කරන්නේ නම්, එය සැලසුමක් අනුව සිදු කළ යුතුය. එසේ සැලසුමක් නොමැතිකම නිසා කාබනික වගාවන්ගෙන් 100% ක් අස්වනු මේ වන විට ලබා ගැනීමට නොහැකි වී ඇත.

පුස්තකාල පොත්පත් නිසි කළමනාකරණයක් නොමැති බවට පුවත්පතක් පල වී තිබුණි. අද දින දක්වන ලද අදහස් වලදී පුස්තකාලය නිසි කළමනාකරණයකින් තිබෙන බවට කරුණු දැක්වුවද, පුවත්පත් නිසි පිළිවෙලකට තබා නොමැති බවටත්, පසුගිය දිනක පුවත්පතක් සොයා ගැනීමට ගිය පසුව එය සොයා ගැනීම සඳහා බොහෝ වෙහෙසක් දැරීමට සිදු වූ බවත්, ජනතාව මා වෙත ප්‍රකාශ කළ හේතුව නිසාම, තමා මේ සම්බන්ධයෙන් මහා සභාවේ දී අදහස් දැක්වීමක් සිදු කරන ලදී. එහිදී තමා පුස්තකාලයේ අඩුපාඩු පිළිබඳ කිසිදු අදහසක් නෙදැක්වූ බවත්, පුස්තකාලය නිසි කළමනාකරණයක් නොමැති බවට තම අදහස් දැක්වූ බවත් ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම අලුත්ගොඩ මාර්ගය සකස් කිරීම ආරම්භ කර දැනට වසර ගණනාවක් වනු ඇත. නමුත් මාර්ගයේ වැඩ මෙතෙක් අවසන් කර නොමැත. මාර්ගය සකස් කිරීමේදී පිළිවෙලකට එය සිදු නොකර, තැනින් තැන කොටසින් කොටස මාර්ගය නඩත්තු කිරීමේ දී, එමගින් ජනතාව අපහසුතාවයට පත් වේ. එම මාර්ගයේ එක් කොටසක ගමන් කිරීමට නොහැකි තරමට වළවල් හැරී අබලන් තත්ත්වයට පත්ව ඇති බැවින්, මෙම කොටස සකස් කිරීම කඩිනම් සිදු කළ යුතුය. එබැවින්, මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ පසුගිය දිනක පැවැති සංගීත ප්‍රසංගයේදී ක්‍රීඩාපිටිය සඳහා ඇති වූ හානිය සඳහා අවශ්‍ය ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා ක්‍රීඩාංගනයේ වැඩ නිම් වාර්තාව සකස් කර ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. චාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම</u>

1970 සිට 1977 වර්ෂයෙන් තුළ පාලනය කළ සමගි පෙරමුණ ආණ්ඩුව, ආණ්ඩුවට පැමිණ එහි පාලකයන් විසින් හොඳ වාමාංශික නායකයින් පිරිසක් එක්ව රට ගැන දැක්මකින් ආර්ථික ප්‍රතිපත්තියක් රට තුළ ඇති කර ගෙන ක්‍රියාත්මක කර ගෙන යන ලදී. 1977 පත් වූ ආණුඩව විසින් මේ රට තුළ ආර්ථික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. රටේ ජනතාව විසින් අප රට තුළ භාණ්ඩයක් ලබා ගැනීම සඳහා පෝලිම් වල සිටීමට සිදුවනවා යනුවෙන් කියනු ලබයි. නමුත් අනෙකුත් රටවල් වලට වඩා සුභ සාධන කටයුතු සිදු කරන ලද්දේ අප රට තුලයි. . 1977 වර්ෂයේ පත් වූ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කලේ නම් අප රට තුළ වැව්ලි ආර්ථිකයක් ඇති කිරීමට තිබුණි. අතීතයේ සෑම ඉඩමක් තුළ කුඩාවට හෝ සෑම බෝගයක්ම වගා කිරීම සිදු කරන ලදී. අද වන විට සිංහලයන් විදියට ලැජ්ජ විය යුතු කරුණක් වන්නේ, සිංහලයන්ගේ කම්මැලිකම නිසා එවැනි බෝගයන් තම ඉඩම තුළ හැකි පමණින් හෝ වගා කිරීමට උනන්දුවක් නොමැතිවීම සම්බන්ධවයි. තමා විසින් ඇප කැප වී කොම්පෝස්ට් කිලෝ 5000 කට වැඩි ප්‍රමාණයක් සකස් කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තමා විසින් සකස් කරන ලද කොම්පෝස්ට් පොහොරවල සාම්පල් රැගෙන ගොස්, එම පොහොර නිසි පරිදි නයිට්‍රජන් තිබෙන හොඳ ප්‍රමිතියෙන් යුතු කාබනික පොහොර බවට දන්වා, තමා සිදු කරන ලද නිෂ්පාදනය වෙනුවෙන් තිළිණයක්ද ලබා දෙන ලදී. මා මේ වන විට වයස්ගතව සිටද මෙවැනි නිෂ්පාදනයක් සිදු කලේ නම් රටේ තරුණ පරපුරට මෙවැනි දේ කළ

නොහැකි වන්නේ ඇයිද යන්නත් සිතිය යුතු කරුණකි. රටේ ජනතාවගේ කම්මැලිකම නිසාම තමන්ගේ උත්සාහයෙන් යම් දෙයක් කිරීමට පෙළඹීමක් සිදු නොවේ.

අප රට වැව්ලි, කෘෂි ආර්ථිකයක් තියන රටකි. කාබනික පොහොර භාවිතය හොද දෙයකි. නමුත් මෙම කාබනික පොහොර භාවිතය සැලසුම් සහගතව සිදු කරන්නේ නම්, එමගින් වඩාත් සාර්ථක කර ගත හැකි වනු ඇත. නමුත් එලෙස සැලසුම් සහගතව සිදු නොකිරීම නිසා මෙම කන්නයේ වී අස්වැන්න 100% ලබා ගැනීමට නොහැකි වී ඇත. කාබනික පොහොර භාවිතයෙන් කෘෂිකර්මාන්තය සිදු කළ හැකි වුවත් එය සැලසුම් සහගතව නිසි කළමනාකරණයකින් යුතුව සිදු කළ යුතුය. යල් කන්නයේ කුඹුරු වගාව සිදු කිරීමේ දී අක්කර 01 ක් සඳහා නිසි ප්‍රමිතියෙන් යුතු කාබනික පොහොරත් සමඟ යුරියා පොහොර හොන්ඩර් 01 ක් ලබා දෙන ලෙසට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඉල්ලීම් කිරීම සුදුසු වනු ඇත. වගාවන් සඳහා අවශ්‍ය කරන පොහොර ලබා දෙන ලෙසට අප සභාවේ සියලුම ගරු සභිකයින් එක්ව කෘෂිකර්ම අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡාවක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

විදුලි වැට ගැසීම සම්බන්ධයෙන් මා මහජන නියෝජිතයෙක් ලෙස පත් වූ දින සිටම මහා සභාවන්වලදී කතා කරන ලදී. වනජීවි දෙපාර්තමේන්තුව එක්ව මීට බොහෝ කාලයකදී දැනට සිටින ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා, වනජීවි අධ්‍යක්ෂකතුමා ගොස් විදුලි වැට ගැසීම සම්බන්ධව නිරීක්ෂණයක් සිදු කර විදුලි වැට ගැසීමට අදාළ කටයුතු සිදු වුවද, එය ක්‍රියාත්මක නොවීය.

1948 නිමලව වැව ආරම්භයේ සිට වගාවන් සිදු කරන ජනතාව අද වන තෙක් එම වගාවන් අඛණ්ඩව සිදු කර ගෙන යනු ලබයි. නමුත් එම වගාවන්හි වැටවල් පිටුපසට ගන්නා ලෙසට වනජීවි දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බැවින්, මේ සම්බන්ධයෙන් වනජීවි දෙපාර්තමේනතුව වෙත දන්වා යවා එම ගොවීන් වෙත සාධාරණයක් ඉටු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

වැව් රක්ෂිත අල්ලා ගැනීම් බෙහෙවින්ම සිදු වනු ඇත. මෙම සියලු වැව් රක්ෂිත වෙන් කර වැව් ආරක්ෂා කර දෙන ලෙසට විෂය භාර ගරු අමාත්‍යතුමා වෙත දන්වා යැවීම සුදුසු වේ.

කොට්ඨාසයේ මාර්ග බොහොමයක් ගමන් කිරීමට නොහැකි ලෙසට අබලන් වී ඇත. එම නිසා ගමන් කිරීමට හැකි වන ලෙසට මෙකී මාර්ග බොරලු යොදා සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

තමා මහජන නියෝජිතයෙන් ලෙස මහා සභා කිහිපයකදීම පෙනී සිටින ලදී. ඒසේ පෙනී සිටි මහා සභා වාරයන්වලට වඩා, මෙකී පාලන කාලය තුළ සියලු කටයුතු නිවැරදිව සිදු කරන බවත්, මහා සභා වාර්තාව කිසිදු ගැටළුවකින් තොරව නිවැරදිව සකස් කරන බවට සහතිකයක් ලබා දිය හැකි බවත්, එකී කටයුතු එසේ නිවැරදිව සිදු කිරීම සම්බන්ධයෙන් ලේකම්තුමියට ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාලයේ පැවැති සුළු අඩුපාඩුවක් යම් කෙනෙකු විසින් ප්‍රකාශ කළද, 2019 වර්ෂයේ හොදම පුස්තකාලය බවට වූ සහතිකය අප ආයතනයේ මහජන පුස්තකාලයට හිමි වී ඇති බවත්, එම ගෞරවණීය නාමය අප පුස්තකාලයේ නිවැරදි ක්‍රියාකාරීත්වය නිසා ලැබී ඇති බවටත් සඳහන් කරන ලදී.

අපගේ පාලන කාලය තුළ ප්‍රාදේශීය සභාවෙන් සිදු කරන ලද කාර්යන් නිවැරදිව විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම නිසා, විගණන දෙපාර්තමේන්තුවෙන් ද අප ආයතනය නිවැරදිව කටයුතු කරන ලද සභාවක් ලෙස ගෞරව නාමය ද ලබා දී ඇත.

අද දින අදහස් දැක්වීම් වලදී රටේ පැවැති ප්‍රශ්න ගැටළු රාශියක් පිළිබඳ සාකච්ඡා විය. රට තුළ ඇති වන ප්‍රශ්න ගැටළු සඳහා අප සියලුම දෙනා එකට එක්ව විසඳුම් සෙවිය යුතුය. අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ක්‍රියාවට නැංවීමේදී රට තුළ විවිධ ව්‍යවසනයන්, බාධා හමුවේ කටයුතු සිදු කිරීමට සිදු විය. 1948 සිට රට පාලනය කිරීමේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය රට ස්වයං පෝෂිත කර ගැනීමට ගත් විවිධ තීන්දු තීරණ වලදී ඒවා අඩපණ ගැන්වීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමේදී විවිධ බාධා ද එම කාලයේදී ද සිදු වී ඇත. එම කාලයේ සේම එවැනි ක්‍රියාවන් අදටත් ඒ ආකාරයටම සිදු වන බවට දැක ගැනීමට හැකි වී ඇත. දේශපාලන පක්ෂ මේ කාලය තුළද විවිද මතවාද ඉදිරිපත් කරනු ලබයි. එලෙස මතවාද ඉදිරිපත් නොකර, අප සියලුම දෙනා එකට එක්ව රට ස්වයං පෝෂිත කර ගැනීමටත්, රට ගොඩනැගීමටත් කටයුතු කළ යුතුය.

රට තුළ දේශපාලන නායකයින් කෙසේ කටයුතු කළත්, අප සභාවක් ලෙස විපක්ෂයක් ලෙස ආණ්ඩු පක්ෂයට ලබා දෙන සහායට ස්තූතිය පුද කරන ලදී. ජාතියක් ලෙස නැගී සිටීමට විවිධ කඳවුරුවලට කතා නොකර, අප රට තුළ පවතින අඩුපාඩු, ගැටළු අප සියලුම දෙනා එක්ව නිවැරදි කර ගැනීම්, විසදා ගැනීම් කර ගත යුතුය. අතිගරු ජනාධිපතිතුමා ජාතිය අමතා කළ ප්‍රකාශයේ දී රට තුළ වගවීම, ජනතාවට ඉටු විය යුතු අවශ්‍යතාවයන්, ලබා දිය යුතු සේවාවන් පිළිබඳව අනිවාරයෙන්ම සොයා බලා කටයුතු කරනවා යන ප්‍රකාශය ලබා දෙන ලදී. එසේම රට තුළ මතු වු විවිධ ව්‍යවසනයන් හමුවේ රට කඩා වැටීමක් සිදු වුවත්, ඉදිරියේ රට සාර්ථක රටක් බවට පත් කරන සහතිකයද ජනතාව වෙත අතිගරු ජනාධිපතිතුමන් විසින් ලබා දෙන ලද බැවින්, එසේ රට සාර්ථක කර ගැනීමේදී රාජ්‍ය යාන්ත්‍රණයේ සහාය දැඩිව ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

රට තුළ ප්‍රශ්න, ගැටළු, අඩුපාඩු නිවැරදි කර ගනිමින් රටක් ලෙස ඒවා නිවැරදි කර ගනිමින් නැගී සිටීමට කටයුතු කළ යුතුය. අනෙක් රටවල් ගත් කළ රාජ්‍ය යාන්ත්‍රණය දැඩි සහායක් රටට ලබා දෙනු ලබයි. අප රට තුළ ද එසේ සහාය ලබා ගැනීමට හැකි වන පරිදි රාජ්‍ය යාන්ත්‍රණයේ සකස් විය යුතුය.

රට තුළ කොවිඩ් රෝගය ව්‍යාප්ත වු අවස්ථාවේ රටේ ජනතාව වෙත කොවිඩ්-19 එන්නත් මාත්‍රා 03 ම ලබා දීමට කටයුතු කරන ලදී. එසේ අවශ්‍ය කරන එන්නත් මාත්‍රා ලබා දී රටේ ජනතාව ඉන් බේරා ගැනීමට කටයුතු සිදු කළ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු මුදල් අමාත්‍යතුමා, ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු දේශපාලන නායකයින් වෙත ස්තූතිය පුද කරන අතර, රට සාර්ථක ලෙස ඉදිරි ගමනක් යාමට ගරු එතුමන්ලා සියලු දෙනා වෙත ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

පෙර අතීතයේ සිට පෙර දිග ධාන්‍යාගාරය ලෙස අප රට තිබුණා සේම, අදටත් අප රට එකී ධාන්‍යාගාරයක් බවට පත් කරලීමටත්, රට තුළ මතුවන සියලු අභියෝග හමුවේ ඒවා දිනා ගෙන ඉදිරි ගමන සාර්ථක කර ගැනීමටත් හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා මාධ්‍යවේන් දෙපල, ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 12.30 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.03.18 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී